සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2014
இரண்டாம் தவணை மதிப்பீடு - 2014
**Second Term Evaluation - 2014**

| | | |
|---|---|---|
| 9 ශ්‍රේණිය<br>தரம் 9<br>Grade 9 | සංගීතය (පෙරදිග) I හා II පත්‍රය<br>சங்கீதம் (கீழைத் தேய) வினாத்தாள்-I&-II<br>Music (Oriental) Paper I & II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>*Two Hours* |

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. භීම්පලාසි රාගයට අයත් සරල ගීයකි.
   1.සාදු දන්ත ධා  2.සැඳෑ අඳුර ලොව
   3.අඳුර අඳුර මගේ  4.සැන්දෑ කළුවර ගලා

2.යමන් රාගයට අයත් ස්වර සංගතියක් වන්නේ
   1. ගමගරිස  2. ත්‍රිරිගරිසපම'ග
   3. ගරිගරිස  4. ධ්‍යනිසරි-ස

3.මාත්‍රා 2 හා 3 බැගින් විභාග වන තාල පදය වන්නේ
   1.දීප චන්දි තාලය  2.කෙහෙරවා තාලය
   3.ජප්තාලය  4.බෙම්ටෝ තාලය

4.බිලාවල් රාගයේ යෙදෙන ආරෝහණ ස්වර වල ග,නි ස්වර කෝමළ කළ විට ලැබෙනුයේ
   1.ඛමාජ් ආරෝහණයයි.  2.භූපාලි ආරෝහණයයි
   3.භීම්පලාසි ආරෝහණයයි.  4.කාෆි ආරෝහණයයි

5. " කළණ මෙලගත පිරුණු නිස ගැයෙන " මෙම ගීතය
   1.යමන් රාගයේ ලක්ෂණ ගීයයි  2.යමන් සර්ගම් ගීයයි
   3.භීම්පලාසි රාගයේ ලක්ෂණ ගීයයි.  4.භීම්පලාසි සර්ගම් ගීයයි

6.දේශීය භාණ්ඩ වර්ගීකරණයට අනුව තම්මැට්ටම හා දවුල අයත් වන්නේ පිළිවෙලින්
   1.ආතත ,විතත  2.විතත , විතතාතත
   3.විතතාත ,ආතත  4.ඝණ ,ආතත

7.බටහිර හෙවත් අපරදිග සංගීත ක්‍රමයේ තාලය හෙවත් කාල සීමාව හැඟ වීම සඳහා යොදා ගනු ලබන තාල සංකේත ක්‍රමය
   1.ටයිම් සිග්නේචර්  2.මිනිම්
   3.ක්‍රොචට්  4.ටයි

8. " ලෙන්චිනා මගෙ නටගියේ,මල්සරා බැල්ම හෙලා " ආදී ගීත නිර්මාණයට පාදක වී ඇති ගීත වර්ගය
   1.ජන ගී  2.රාගධාරී ගී
   3.කව්වාලි ගී  4.නාට්‍ය ගී

9.පෙර දිග මුතු ඇටයයි මේ,රත්නදීප ජන්ම භූමි ආදී ගීත අයත් වන්නේ

1.වේදිකා නාට්‍ය ගී වලටය
2.දේශාභිමානී ගී වලටය
3.නව නාට්‍ය ගී වලටය
4.ග්‍රාමගෝන් ගී වලටය

10.කෙත හා බැඳි ගීත වර්ගයක් නොවන්නේ

1. ගොයම් ගී
2. නෙළුම් ගී
3. කමත් ගී
4. බඹර ගී

11. ග - ම| ප- ග | ම- ග |රි - -| යන ස්වර පාදය මධ්‍යම භාවයෙන් ලියූ විට නිවැරදි පිළිතුර වන්නේ

1. ධ - නි |ස̇ - ධ |නි - ධ |ප - -
2. නි - ස̇ |රි̇ -නි |ස̇ -නි |ධ̣ - -
3. නි̣ - ස| රි - නි̣|ස - නි̣ |ධ̣ - -
4. ග̇ - ම̇| ප - ග̇ |ම̇ - ග̇ |රි̇ - -

12.කව්වාලි ගායන ශෛලියට අනුව ගැයෙන සරල ගී යුගලයකි.

1. නැති බැරි මොහොතක පිහිටට එන්නේ-සරුංගලේ වරල් සැලේ
2. රුක් අත්තන මල මුදුනේ-අම්මා සඳකි මම ඒ ලොව
3. මගේ රටට දළදා හිමි සරණයි-ආදරයේ උල්පත වූ අම්මා
4. සුවඳේ මට සීතල සුළඟ පවා-මංගලම් ජය මංගලම්

13." බුම්මැඩිය " වාදනය කරනුයේ

1.ගොයම් ගී ගායනයේදී
2.නෙළුම් ගී ගායනයේදී
3.කමත් ගී ගායනයේදී
4.පැල් කවි ගායනයේදී

අංක 14 සිට 18 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී පහත වගුව උපයෝගී කර ගන්න.

| A<br>ගැට බෙරය | B<br>පහතරට බෙරය | C<br>දවුල | D<br>තම්මැට්ටම | E<br>හොරණෑව |
|---|---|---|---|---|

14. උඩරට නර්තන සම්ප්‍රදාය හා බැඳුනු තාල වාද්‍ය භාණ්ඩය

1. B  2. C  3. E  4. A

15.හේවිසි වාදනයේදී අනිවාර්යයෙන්ම වාදනය කෙරෙන භාණ්ඩ ත්‍රිත්වයකි.

1 A,B,C  2. A,C,D  3.C,D,E  4. A,B,E

16 පොකුරු බෙරය සේ සලකනු ලබන්නේ

1. D  2. B  3.A  4.C

17.සබරගමු නර්තන සම්ප්‍රදාය හා බැඳුනු තාල වාද්‍ය භාණ්ඩය

1. B  2.A  3.C  4.D

18 ශෝක බෙරය සේ සලකනු ලබන්නේ

1. A  2.C  3.D  4.B

19 රාත්‍රී කාලයේ අම්බරුවන් යොදා ගෙන ගොයම් කොළ පෑගීමේදී ගයනු ලබන ගී

1.ගොයම් ගී  2.නෙළුම් ගී  3.කමත් ගී  4.සේ ගී

20.දෙවියන් ගේ ගුණ වර්ණනා කරමින් ගයන ලද ගීත

1. ගසල් ගී  2.භජන් ගී  3.බනල් ගී  4.තරානා ගී

## <u>2 කොටස</u>

<u>ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.</u>

(1)

i) පහත සඳහන් ලක්ෂණ ඇතුලත් රාගයේ නම ඉදිරියෙන් ලියන්න.

A. රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයෙන සම්පූර්ණ ජාති රාගයකි.

B. ම . ස වාදී . සංවාදී වන ඖඩව සම්පූර්ණ ජාති රාගයකි.

C. නි̣ ස ග ම ප . ප ග ම ලෙස ස්වර සංගති යෙදෙන කාෆි ථාටයෙන් උපදින රාගයකි.

D. ග . නි ස්වර වාදී සංවාදී වන කල්‍යාණ ථාටයෙන් උපදින රාගයකි.

(ල.04)

ii) ඉහත රාග අතරින් කැමති රාගයක් තෝරා ගෙන රාගයේ නම ලියා එහි සරගම් ගීතය හෝ ලක්ෂණ ගීතය හෝ මධ්‍යලය ගීතයේ ස්ථායී කොටස පමණක් ගීත ස්වර ප්‍රස්ථාර කරන්න.

(ල 04)

iii) ඉහත රාග දෙකේ ආරෝහණ,අවරෝහණ පිළිවෙලින් ලියන්න.

(ල 02)

(2)

i) පහත දැක්වෙනුයේ දේශීය අවනද්ධ භාණ්ඩ කීපයකින් වාදනය කෙරෙන පද කීපයකි.එම පද ඉදිරියෙන් අදාළ භාණ්ඩයේ නම ලියන්න.

A. ත කු ජිං ජිං තත් ජිං තක ජිං කුද

B. ජෙං කිටි කිටි තක තත් කිට ගත් ජෙං

C. ගුම් ගුද ගදි ගත ගදි ගත ගුදි ගත

(ල 03)

ii) ඉහත නම් කළ භාණ්ඩ තුනෙන් එක් භාණ්ඩයක් රූප සටහනක් ඇඳ ප්‍රධාන කොටස් 4ක් ලකුණු කරන්න.(ල 06)

iii) එම භාණ්ඩය වාදනය සඳහා යොදා ගත් අවස්ථාවක් ලියන්න.

(ල 01)

(3)

i) ගොයම් ගී , නෙළුම් ගී හා කමත් ගී පිළිබඳව සුවිශේෂී ලක්ෂණ, 2 බැගින් ලියන්න. (ල 06)

ii) <u>අම්බරුවන්</u> පස් දෙනාම කැරැල්ලේ බදිමු.

<u>කොළ මඩින්ට</u> අපි එකද්කදං හැන්දෑ ජාමේ

බැත ටික ටික <u>යතුරට</u> දමමින් පොලා ගමු

<u>බෝල් අත්ත</u> ගෙන මැඩුවන් එක්කර ගනිමු

ඉහත ගීතයේ ඉරි ඇඳි පද වල තේරුම ලියා දක්වන්න. (ල 04)

The National e-learning Portal for The General Education

(4)

i) පහත දැක්වෙන ගී පාද විභාග වශයෙන් වෙන් කොට පද ප්‍රස්තාර කරන්න.

අ) උදේ සුපිපුණු මලක් විලසට
මවගෙ මුහුණේ සිනා සුදිලේ

ආ) නිල් අහස මත දිලෙන
තරු පොකුරු මල් වගෙයි

(ල 04)

ii) එම ගී පාද දෙක වාදනයට සුදුසු තාල පද නම් කරන්න. (ල 02)

iii) මින් ඔබ කැමති එක් තාලයක් ප්‍රස්තාර කරන්න (ල 03)

iv) ඔබ ප්‍රස්තාර කළ තාලයට අයත් දේශීය තිත නම් කරන්න (ල 01)

(5) i) පංච තූර්ය භාණ්ඩ වර්ගීකරණය උදාහරණ සහිතව දක්වන්න.(රූප සටහන් හෝ වගුවක් ආශ්‍රයෙන්) (ල 05)

ii) ඉන් ඔබ කැමති භාණ්ඩය ක රූප සටහනක් ඇඳ එම භාණ්ඩය පිළිබඳව කරුණු 3ක් ලියන්න. (ල 05)

The National e-learning Portal for The General Education

100